සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2022 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2022-03-27
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, තනිව්‍යාපාරයක් සමඟ සැසඳීමේදී සීමාසහිත පෞද්ගලික සමාගමක ඇති වාසියක් වන්නේ කුමක් ද?

(1) වගකීම අසීමිත වීම.
(2) ඉක්මන් තීරණ ගැනීමේ හැකියාව.
(3) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
(4) වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම.

**1.2** සීමාසහිත පෞද්ගලික සමාගමක සිටිය හැකි උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව වන්නේ:

(1) 2. (2) 20. (3) 40. (4) 50.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) පණිවුඩය යවන්නා. (2) අවධානම. (3) පණිවුඩය ලබන්නා. (4) ප්‍රතිපෝෂණය.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, විදේශ වෙළඳාමේදී භාවිත වන මූලික ලියවිල්ලක් **නොවන්නේ** කුමක් ද?

(1) කොටස් සහතිකය.
(2) නෞභාරපත.
(3) ප්‍රභවස්ථාන සහතිකය.
(4) වාණිජ ඉන්වොයිසිය.

**1.5** චෙක්පතක රේඛණයක් අවලංගු කළ හැකි පාර්ශවයක් වන්නේ:

(1) අණලද්දා. (2) අණකරු. (3) ආදායකයා. (4) බැංකුව.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, හොඳ ප්‍රවාහන ක්‍රමයක ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) වේගය. (2) සුරක්ෂිත බව. (3) සුලභ නොවීම. (4) ධාරිතාව.

**1.7** ශ්‍රී ලංකාවේ තත්කාලීන දළ පියවීම් පද්ධතිය (Real Time Gross Settlement System) හඳුන්වා දෙනු ලැබුවේ:

(1) ශ්‍රී ලංකා මහ බැංකුව මගිනි. (2) බලපත්‍රලාභී විශේෂිත බැංකු මගිනි.

(3) මූල්‍ය සමාගම් මගිනි. (4) කොළඹ කොටස් හුවමාරුව මගිනි.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකත්වයේ සමාජීය සහ ආර්ථික ප්‍රතිලාභයක් **නොවන්නේ** කුමක් ද?

(1) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම. (2) දිළිඳුකම පිටුදැකීම.

(3) සාධාරණ තරඟකාරීත්වයක් නිර්මාණය කිරීම. (4) නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් [Small and Medium Sized Enterprise (SME)] මුහුණදෙන අභියෝගයක් වන්නේ කුමක් ද?

(1) ආර්ථික පිරිමැසුම්වල හිඟකම. (2) කුසලතා හිඟකම.

(3) දුර්වල කළමනාකරණ පරිචයන්. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කාර්යසාධනය ඉහළ නැංවීමේ ක්‍රමයක් **නොවන්නේ** කුමක් ද?

(1) නවීන තාක්ෂණය. (2) ව්‍යවසායකත්ව සංස්කෘතිය.

(3) මූල්‍ය සඳහා ප්‍රවේශය. (4) දුර්වල නායකත්වය.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** කොටස්, ණයකර වැනි දෑ මුදල් වෙළෙඳපොළේ ගනුදෙනු වන උපකරණ වේ.

**1.12** හානිපූර්ණ මූලධර්මය, ජීවිත රක්ෂණයේදී අදාල වේ.

**1.13** රහසිගත තොරතුරු තෙවන පාර්ශවයකට විකිණීම, ව්‍යාපාරික ආචාරධර්ම උල්ලංඝනය වීම සඳහා උදාහරණයකි.

**1.14** සේවකයන් 300 කට වඩා වැඩියෙන් සේවයේ නියුතු අස්තිත්වයක්, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයක් ලෙස සලකනු ලැබේ.

**1.15** නිවසේ කටයුතු සඳහා වැඩි කාලයක් කැපකිරීමේ අවශ්‍යතාවය, කාන්තා ව්‍යවසායකත්වය විසින් මුහුණ දෙනු ලබන අභියෝගයකි.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 අවශ්‍යතා සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

1.17 ව්‍යවසායකත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

1.18 භාණ්ඩ සහ සේවාවන් අතර වෙනස්කම් දෙකක්(02) සඳහන් කරන්න.

1.19 ව්‍යවසායකත්වයේ අවශ්‍යතාවය වැඩිවීමට බලපාන හේතු දෙකක්(02) සඳහන් කරන්න.

1.20 බද්ධ ව්‍යාපාරයක ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

**"ගුරුතලා", අමිලට** අයත් සුපිරි වෙළෙඳසැල් ජාලයකි. දැනට එයට අයත්ව අලෙවිසැල් 12 ක් කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පිහිටා ඇත. දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලට **"ගුරුතලා"** වෙළෙඳසැල් ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව, වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගැනීමට **අමිල** ට අවශ්‍ය වී ඇති අතර, ඉදිරි වර්ෂ 5 තුළදී **"ගුරුතලා"** සුපිරි වෙළෙඳසැල් ජාලය, කොළඹ කොටස් හුවමාරුවේ (Colombo Stock Exchange) ලියාපදිංචි කිරීමට ඔහු සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) (i) වර්තමානයේ **"ගුරුතලා"** වෙළෙඳසැල් ජාලය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය **හඳුනා දක්වන්න**. (ලකුණු 01)

(ii) එවැනි ව්‍යාපාර සංවිධාන වර්ගයක ලක්ෂණ තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) සීමාසහිත පොදු සමාගමක ලක්ෂණ තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත කොහු සමාගම,** පොල් ලෙලි මූලික අමුද්‍රව්‍යය ලෙස භාවිතකර කොහු නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවකි. පොල් ලෙලිවලින් ඉවත් කරගන්නා ලද කෙඳි කර්මාන්තශාලාව ආසන්නයේ පිහිටි ගොඩනැගිල්ලක ගබඩා කරයි. පසුගිය සිකුරාදා දින සවස, ආයතනයේ මෙම ගබඩාව ගිනි ගැනීමට ලක්වූ අතර, එමගින් **සීමාසහිත කොහු සමාගමට** රු.මිලියන 1 ක අලාභයක් සිදුවී ඇත. **සීමාසහිත කොහු සමාගම** රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත කොහු සමාගමට** සුදුසු රක්ෂණ ආවරණයක් **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) **සීමාසහිත කොහු සමාගම** විසින් ලබා ගන්නා ලද රක්ෂණ ආවරණයට අදාලව රක්ෂ්‍ය හිමිකම (insurable interest) සහ ආසන්නතම හේතුව (proximate cause) යන රක්ෂණ මූලධර්ම බලපාන ආකාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) රටක ආර්ථික සංවර්ධනයට රක්ෂණය දායකත්වය දක්වන ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**ODO** යනු ආපන ශාලා සහ බේකරිවලින් ආහාර ලබාගෙන තම බෙදාහැරීමේ ජාලය මගින් පාරිභෝගිකයන්ට බෙදාහරින මාර්ගගත (online) ක්‍රමයකි. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුකොටගෙන, නව අවන්හල් කිපයක්ම **ODO** ආයතනයේ බෙදාහැරීමේ සේවා ලබාගැනීමට හවුල් වී ඇති බැවින් එය ආයතනයේ ලාභය වැඩිවීමට හේතු වී ඇත. **ODO** මාර්ගගත ක්‍රමය භාවිතයෙන්, පාරිභෝගිකයන් ට කැමති ආපන ශාලාව හෝ බේකරිය තෝරා මුදල් ගෙවීමෙන් පසු අදාල ඇණවුම කිරීමට පුළුවනි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) නිසි ලෙස කළමනාකරණය කරන ලද බෙදාහැරීමේ ක්‍රමයක ඇති වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) මාර්ගගත ක්‍රමයට ආහාර බෙදාහැරීමේ ක්‍රමයක් භාවිත කිරීමේදී, **ODO** ආයතනයේ පාරිභෝගිකයින් විසින් සළකා බැලිය යුතු සාධක තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) **ODO** ආයතනයේ ව්‍යාපාරික කටයුතු සඳහා රජය මැදිහත්වන ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

**ලලිත් බණ්ඩාර,** මීට දශක කිපයකට පෙර කහටගල මංසන්ධියේ පිහිටා ඇති **බණ්ඩාර තේ වෙළෙඳ සැල** ආරම්භ කළ **ටිකිරි බණ්ඩාරගේ** මුණුපුරාය. මෙම තේ වෙළෙඳසැළ ප්‍රධාන මාර්ගය ආසන්නයේම පිහිටා ඇති බැවින් කහටගල දිය ඇල්ල නැරඹීමට පැමිණෙන බොහෝ සංචාරකයන් මෙම තේ වෙළෙඳසැළට පැමිණේ. තවද, **බණ්ඩාර** තම පවුලේ ව්‍යාපාරය අඛණ්ඩව කරගෙන ගිය අතර, සංචාරකයන් වැඩි ප්‍රමාණයක් ආකර්ශනය කර ගැනීම සඳහා ක්‍රෙඩිට් කාඩ්පත් (ණයපත්) පහසුකම් ද සමඟ, කුඩා සුපිරි වෙළෙඳසැළක් සහ සිහිවටන කුටියක් (souvenir stall) සමඟ තේ වෙළෙඳසැළ පුළුල් කරනු ලැබිය. ඔහු තම ව්‍යාපාරය පුළුල් කිරීමේ අරමුණින් වාණිජ බැංකුවකින් ණය මුදලක් ලබාගන්නා ලදී. **බණ්ඩාර තේ වෙළෙඳ සැළ,** බැංකුවේ පැරණිතම ගනුදෙනුකරුවෙක් වූ බැවින් බැංකු කළමනාකරු මෙම ණය මුදල ලබාදීමට සහාය විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **බණ්ඩාර තේ වෙළෙඳ සැළෙහි** භාවිත කරනු ලබන මුදල් වර්ග දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී, ණය පහසුකම හැරුනු විට වාණිජ බැංකුවකින් **බණ්ඩාරට** ලබාගතහැකි සේවාවන් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කිරීමෙන්, **බණ්ඩාර තේ වෙළෙඳ සැළට** ළඟා කරගත හැකි ප්‍රතිලාභ දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**රුබෙක්ස්,** කොළඹ කොටස් හුවමාරුවේ (Colombo Stock Exchange) ලැයිස්තුගත සමාගමක් වන අතර, ස්වභාවික රබර් මගින් කොට්ට, මෙට්ට සහ අත්වැසුම් නිපදවා අපනයනය කරනු ලබයි. ඔවුන්ගේ නිෂ්පාදිත යුරෝපීය රටවලට අපනයනය කරනු ලබන අතර, සුප්‍රසිද්ධ සුපිරි වෙළෙඳසැල් සන්නාමයක් යටතේ පාරිභෝගිකයන් අතර ජනප්‍රිය වී ඇත. **රුබෙක්ස්** හි නිෂ්පාදන ක්‍රියාවලිය සීමිත ශ්‍රම දායකත්වයක් සහිත අර්ධ ස්වයංක්‍රීය (semi-automated) ක්‍රියාවලියකි. කෙසේවෙතත්, **රුබෙක්ස්** හට එහි මෙහෙයුම් සිදුකිරීමේදී සමහර පියවරයන් සඳහා නිපුණතා සහිත ශ්‍රමිකයන් අවශ්‍ය වේ. නිෂ්පාදන සේවකයන් බඳවා ගැනීමෙන් පසු ඔවුන්ට මාසයක වැඩ පදනම් කරගත් පුහුණුවක් ලබාදේ. කෙසේවුවද, නොවැලැක්විය හැකි දුගඳ සහිත වැඩ පරිසරය හේතුකොටගෙන ආයතනයේ ශ්‍රම පිරිවැටුම සැලකිය යුතු ඉහළ මට්ටමක පවතී. ප්‍රදේශයේ පවතින ඇඟළුම් කර්මාන්තශාලාවල ඇති රැකියා අවස්ථාවන් ද **රුබෙක්ස්** හි ඉහළ ශ්‍රම පිරිවැටුමට දායක වී ඇත. මෙම ශ්‍රම ගැටළු සමඟ **රුබෙක්ස්,** කර්මාන්තශාලා ස්වයංක්‍රීය ව්‍යාපෘතීන්ට පරිවර්තනය විය. තවද, නිවාස ව්‍යාපෘති සඳහා රබර්වතු විකිණීම, අමුද්‍රව්‍ය අවශ්‍යතාවයන්ට අහිතකර ලෙස බලපා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස **රුබෙක්ස්** තායිලන්තයේ විදේශීය අමුද්‍රව්‍ය සැපයුම්කරුවෙකු වෙත යොමුවී ඇත.

කොවිඩ්-19 වසංගත තත්ත්වය, **රුබෙක්ස්** ට සෘණාත්මක මෙන්ම ධනාත්මකව ද බලපා ඇත. යුරෝපීය සුපිරි වෙළෙඳසැල්වලින් ලද සමහර නිත්‍ය ඇණවුම් අවලංගු වුව ද අත්වැසුම් සඳහා දේශීය සහ විදේශීය ගනුදෙනුකරුවන්ගෙන් නව ඇණවුම් ලැබී ඇත. කඩිනම් කර්මාන්තශාලා ස්වයංක්‍රීයකරණය නිසා කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ ඉතා සීමිත ශ්‍රමිකයන් පිරිසකගෙන් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට ද මඟ පෑදුණි. අනෙක් අතට කොවිඩ්-19 වසංගත තත්ත්වයේදී පැන නැගුණු ඩොලර් අර්බුදය, **රුබෙක්ස්** හි අමුද්‍රව්‍ය ආනයනයට ද බලපෑම් කොට ඇත. කෙසේවෙතත්, රජයේ මැදිහත්වීමෙන් බැංකු සහ අනෙකුත් රාජ්‍ය ආයතන කිපයක් දේශීය අපනයනකරුවන්ට ලබා දුන් සහන **රුබෙක්ස්** ට ඉමහත් සහනයක් සලසාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ජාත්‍යන්තර වශයෙන් ව්‍යාපාර කටයුතු සිදුකිරීමෙන් **රුබෙක්ස්** ට ලැබෙන වාසි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) ශදුඅත (SWOT) විශ්ලේෂණය භාවිතයෙන් **රුබෙක්ස්** හි ව්‍යාපාරික පරිසරය **තක්සේරු කරන්න.** (ලකුණු 06)

(c) **රුබෙක්ස්** ට ප්‍රවාහනය සහ සැපයුම් සේවා (logistics) කටයුතු වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(d) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා **රුබෙක්ස්** හි දායකත්වය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(e) ආයෝජකයන්ට කොළඹ කොටස් හුවමාරුව (Colombo Stock Exchange) වැදගත් වීමට හේතු තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

**කළ යුතු ඇයා පරයාමා ලැයස්තුව**

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |